NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## තුන්වන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 8 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය : පැය 1 |
|---|---|---|

## 6 වන ඒකකය

### I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) වර්තමාන අධ්‍යාපනයේ පුද්ගල නිපුණතා පෝෂණය කර අපේක්ෂා කරන්නේ,
1) විභාග ජය ගැනීමට 2) සමාජ සංවර්ධනයට
3) අරමුණු ඉටු කර ගැනීමට 4) අනාගත රැකියාවකට සුදානම් කිරීමට

(2) රැකියාවක් කිරීමේ දී වඩා වැදගත් වන්නේ,
1) ආදායමට 2) ඉටුවන සේවයට
3) සමාජ පිළිගැනීමට 4) හිමිකම් වලට

(3) තමන් කරන කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටු කිරීම හඳුන්වන්නේ,
1) සුරක්ෂිතතාව ලෙස 2) සමාජානුයෝජනය ලෙස
3) අනන්‍යතාව ලෙස 4) ශ්‍රමාභිමානය ලෙස

(4) පුද්ගලයෙකු ඔහුගේ වෘත්තියට අදාල දෛනිකව ඉටු කළ යුතු ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාව හඳුන්වන්නේ,
1) වැඩලෝකය ලෙසය. 2) ශ්‍රමය ලෙසය.
3) අභියෝග ලෙසය. 4) චේතනය ලෙසය.

(5) ශ්‍රමාභිමානයෙන් සේවා ලාභින්ට අත්වන ප්‍රයෝජනයක් නොවන්නේ,
1) කාර්යක්ෂමතාව ඇතිවීම. 2) විශ්වාසය ඇතිවීම.
3) ලාභය වැඩිවීම. 4) චිත්තවේග සමබරතාව.

- **පහත සඳහන් ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණද වරහන් තුළ යොදන්න.**

(6) වර්තමානයේ බොහෝ දෙනාගේ තේරීම වී ඇත්තේ ඉහළ පිළිගැනීමයක් ඇති රැකියාවක් කිරීමටයි. (     )

(7) සමාජ ප්‍රගමනය යනු සමාජයේ ඉදිරිගමන හෙවත් දියුණුවයි. (     )

(8) රැකියාව සඳහා ශ්‍රමය වැදගත් වන අතර නුපුහුණු ශ්‍රමයට ඉහළ ඉල්ලුමක් තිබේ. (     )

(9) සේවාදායකයා තෘප්තිමත්ව තබා ගැනීම සේවාලාභියාගේ වගකීම වේ. (     )

(10) වැඩ ලෝකයේ විවිධත්වයක් දක්නට ලැබේ. (     )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **පහත සඳහන් වචන යොදා හිස්තැන් පුරවන්න.**

(කාර්යසාධනය, සේවක අයිතිවාසිකම්, සහයෝගයෙන්, වෘත්තිය, වැටුප)

(11) සමාජයේ සියලු පුද්ගලයින් ...................................... කටයුතු කිරීමෙන් සමාජ ප්‍රගමනයක් ඇති වේ.

(12) ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභය ................................ ලෙසින් හැඳින්වේ.

(13) පුහුණු ශ්‍රමිකයින්ට ........................................ ට අදාල විශේෂ පුහුණුවක් තිබිය යුතුය.

(14) ........................................ යනු සේවාදායකයාට තම රැකියාව කර ගෙන යාමට ලැබෙන අයිතීන්ය.

(15) තම දක්ෂතා උපරිම මට්ටමින් ක්‍රියාවට නැංවීම ............................................. ලෙස හැඳින්වේ.

- **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| (16) | නුවර එළිය | වේවැල් කර්මාන්තය |
| (17) | පිළිමතලාව | වෙස් මුහුණු හා රූකඩ |
| (18) | අම්බලංගොඩ | මැටි ආශ්‍රිත නිෂ්පාදන |
| (19) | මොළගොඩ | පිත්තල බඩු |
| (20) | වේවැල් දෙණිය | එළවළු, මල් වගාව |

(ලකුණු 1 x 2 = 40)

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) රැකියාවක් තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු 3 ක් ලියන්න.
(2) වැඩලෝකය යන්නෙහි අදහස පහදන්න.
(3) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා 3 ක් නම් කරන්න.
(4) කාර්මික ක්ෂේත්‍රයේ රැකියා 3ක් නම් කරන්න.
(5) ස්වයං රැකියා 3 ක් නම් කරන්න.
(6) සේවා ලෙස සැලකෙන රැකියා 3 ක් ලියන්න.
(7) ඇඳුම් මැසීමේ කර්මාන්ත ශාලාවක ඇති රැකියාවන් 3 ක් ලියන්න.
(8) වැඩ ලෝකයේ පවතින රැකියා ප්‍රධාන ක්ෂේත්‍ර 3කට බෙදේ. ඒවා නම් කරන්න.
(9) ශ්‍රමය ප්‍රධාන කොටස් 2කට බෙදේ. ඒවා නම් කරන්න.
(10) වැඩි වශයෙන් මානසික ශ්‍රමය යොදවන රැකියා 3ක් ලියන්න.
(11) වැඩි වශයෙන් කායික ශ්‍රමය යොදවන රැකියා 3 ක් ලියන්න.
(12) ශ්‍රමාභිමානය දක්නට ලැබෙන රැකියා 3 ක් ලියන්න.
(13) තමා රැකියාවක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න.
(14) ''මිනිසුන් වැඩ කරන්නේ ඇයි?'' යන ප්‍රශ්නයට ජෝන් ෆොස්ටර් හා සිමෝ ෆොස්ටර් දුන් පිළිතුර කෙටියෙන් ලියන්න.
(15) ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීම නිසා සේවයෝජකයාට අත්වන ප්‍රයෝජන 3 ක් ලියන්න.
(16) ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීම නිසා සේවාදායකයාට ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න.
(17) සමාජ ප්‍රගමනයට සම්පූර්ණ විය යුතු අවශ්‍යතා 3 ක් ලියන්න.
(18) රැකියා සඳහා පුද්ගලයින් පුහුණු කිරීම ක්‍රම දෙකකට සිදුකළ හැකියි. එම ක්‍රම 2 නම් කරන්න.
(19) වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන 3 ක් නම් කරන්න.
(20) යහපත් ශ්‍රමිකයෙකු සතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 1 x 3 = 60)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!